72

# පරාරෝපණ සංකල්පය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්

එච්. ඩී. ජයන්ති සෙනෙවිරත්න

දර්ශන අංශය

කැළණිය විශ්ව විද්‍යාලය

කැළණිය

දර්ශන ශාස්ත්‍රපති උපාධිය සඳහා මවිසින්

කැළණිය විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කරන ලද

නිබන්ධනයයි.

ප්‍රවේශ අංකය 72

වර්ග අංකය

1985

## විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රකාශය

## පරාරෝපණ සංකල්පය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්

1. සමකාලීන පාශ්චිමීය දර්ශනය දෙස විමසුම් ඇසින් බලන විට එහි ඇතුළත් විවිධ මත සහ සංකල්ප ඓතිහාසික වශයෙන් සංවර්ධනය වී ඇති බව පැහැදිලිව පෙනේ. නූතන භාෂාමය දර්ශනය පවා ප්ලේටෝ ගේ සමයේ සිට සියුම්ව ඇරඹී ඇති අයුරු ප්ලතෝනීත 'ක්‍රැටිලස් සංවාදය' ආදී කෘති වලින් පෙනී යයි. එහෙයින් සමකාලීන දර්ශන ක්ෂේත්‍රයේ පැනෙන විවිධ චින්තා ඉතිහාස නයින් මෙන්ම විවේචනාත්මකවද විමසා බැලීම ඉතාමත් ඵලදායකය. මේ අනුව පරාරෝපණ සංකල්පය පිළිබඳවද විචාර පූර්වක අධ්‍යයනයක යෙදීම යෝග්‍ය වෙයි. ඓතිහාසික සහ විවේචනාත්මක ද වූ දෘෂ්ටිකෝණයකින් මෙම චින්තාව ප්‍රමාණවත් අධ්‍යයන-යකට මේ දක්වා යොමු කර නොතිබීම බලවත් අඩුපාඩුවකි. එමනිසා මෙම විෂය පිළිබඳව පර්යේෂණාත්මක අධ්‍යයනයක යෙදීමට අදහස් කරමු.

2. පරාරෝපණ සංකල්පය දර්ශන ක්ෂේත්‍රයට අයත් විඥානවාදී සහ භෞතිකවාදී යන ප්‍රධාන ප්‍රවනතාවයන් දෙකටම සම්බන්ධව පවතී. එහි විඥානවාදී පක්ෂය පිළිබඳ සූක්ෂම හීජ ග්‍රීක දර්ශනයට අයත් ඇතැම් අංශවල නිලීනව පවතී. එසේ වුවද නූතන බටහිර දර්ශනයෙහි ලා මෙම සංකල්පය අලුතින් සාදා ඉදිරිපත් කරන ලද්දේ ජර්මන් විඥානවාදී

දාර්ශනික ජොහැන් ජී. ෆිච්ටේ විසිනි. ඔහුට පසුව පැමිණි ශ්‍රේෂ්ඨතම ජර්මන් විඥානවාදී දාර්ශනිකයා වූ ජෝර්ජ් හෙගල් විසින් ස්වකීය ද්විඝටනාත්මක විඥානවාදය නම් වූ සම්ප්‍රදාය ඇසුරුකොටගෙන මෙම සංකල්පයට අමරණීය භාවිතයක් ලබා දෙන ලදී.

3. පරාරෝපණ සංකල්පයට භෞතිකවාදී භාවිතයක් ලබා දීමේ මුල්ම ගෞරවය ජර්මන් භෞතිකවාදී දාර්ශනික ලුඩ්විග් ෆෝර්බාච්ට හිමිවෙයි. එසේවුවද හෙගලියානු විඥානවාදයෙන් සහ ෆෝර්බාච්යානු භෞතිකවාදයෙන් පෝෂණය ලැබූ කාල් මාක්ස් විසින් එම සංකල්පයට නවතම භෞතිකවාදී පදනමක් දමන ලද බව පෙනී යයි. නව මාක්ස්වාදී ගුරුකුලයට අයත් යැයි හඳුන්වනු ලබන එරිච් ෆ්‍රොම්, රයිට් මිල්ස් සහ අර්නස්ට් මන්ඩේල්යන අය විසින් මාක්ස්වාදී පරාරෝපණ සංකල්පය වැඩිදුරටත් දියුණුකොට ඉංග්‍රීසි කතා කරන බටහිර ලෝකයට හඳුන්වා දෙන ලදී.

4. මෙම සංකල්පයේ සදාචාර පක්ෂය මැනෙවින් පැහැදිලි කර දීමට මාක්ස්වාදය මෙන්ම සාංදෘෂ්ටිකවාදයද සමත් වූ බව කිව හැකිය. සාංදෘෂ්ටිකවාදීන් විසින්, විශේෂයෙන්ම සාත්‍රේ විසින් පරාරෝපණයේ මනෝවිද්‍යාත්මක පක්ෂය කෙරෙහි අවධානය යොමු කොට ලැබ ඇති නිසා එහි මනෝවිද්‍යාත්මක ස්වරූපයද මෙහිලා විමසා බැලීමට අදහස් කරමු. එසේම මෙම සංකල්පයේ ප්‍රායෝගික පක්ෂය පෙන්නුම් කිරීමේ නිදසුනක් හැටියට 'ශ්‍රී ලංකාවේ තරුණයන්ගේ පරාරෝපණය' ද මෙහිලා විමර්ශණයට ලක් කෙරේ. මේ ආදී

නයින් විමසා බැලීමට අදහස් කරන උක්ත පර්යේෂණයේ දළ සැලැස්ම මෙසේ ය.

## පරාරෝපණ සංකල්පය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්

පළමුවැනි පරිච්ඡේදය - පරාරෝපණ සංකල්පයේ ප්‍රභවය සහ සංවර්ධනය

දෙවැනි පරිච්ඡේදය - පරාරෝපණය පිළිබඳ මාක්ස්වාදී විග්‍රහය

තුන්වැනි පරිච්ඡේදය - පරාරෝපණයෙන් මිදීම පිළිබඳ මාක්ස්වාදී සහ සාංදෘෂ්ටිකවාදී විග්‍රහයන්හි දක්නට ලැබෙන වෙනස්කම්

හතරවැනි පරිච්ඡේදය - පරාරෝපණයේ මනෝවිද්‍යාත්මක ස්වරූපය

පස්වැනි පරිච්ඡේදය - ශ්‍රී ලංකාවේ තරුණයින්ගේ පරාරෝපණය

නිගමනය